# රුක් වගා ව්‍යාපාරය.

රුක් සංරක්ෂණය පිළිබඳ අන්තර් ජාතික වැඩ සටහන.
අපට එකදෙන රුක් එක ගනිමු–රාජකීය උද්භිද උද්‍යානය,
පේරාදෙණිය.

රුක් අපගේ ජීවිත ආරක්ෂා කරයි. ඒවා අපට ඇවැසි රෙදිපිළි, ආහාර පමණක් නොව ඖෂධ සහ බෙහෙත් වර්ග ද සපයා දෙයි. අපගේ ශරීරයට අවශ්‍ය උත්තේජක වර්ග තේ, කෝපි වැනි දෑ සපයයි. අපගේ උරුමය වන පස, සෝදා යාමෙන් ආරක්ෂා කොට, පරිසරය ගිල ගන්නා කාන්තාර බවට පත්වීම නවතා ලයි. ප්‍රභා සංශ්ලේෂණයේ නිත්‍ය කාර්යාවලිය මගින්, සූර්ය ශක්තිය සීනි සහ පිෂ්ඨය බවට පෙරළමින්, අපට අවශ්‍ය කරන ශක්තියෙන් වැඩි ප්‍රමාණයක් ලබා දෙයි. ඉතාමත් සරලව කිවහොත්, ශාකයන්ගේ පැවැත්මෙන් තොරව මේ පෘථිවිතලය තුළ අපගේ පැවැත්ම හුදු සිහිනයක් පමණක් වනු ඇත. එතෙකුදු වුවත් අප මෙතුවක් කල් මේ වැදගත් කාරණය සම්බන්ධයෙන් නිසි සැලකිල්ලෙන් නෙත් යොමා නැති අතර, මෙම වටිනා සම්පත සංරක්ෂණය කර ගැනීම සඳහා ව්‍යාපාරයක් දියත් කිරීමට 1984 වර්ෂය උදාවන තෙක්ම පියවර ගෙන නැත.

1984 මාර්තු මස 21 දින, ලෝක වන සත්ව ආරක්ෂක ආයතනය හා පරිසරය සහ පරිසර සම්පත් සුරැකීමේ අන්තර් ජාතික සංවිධානය ඒකාබද්ධව ලෝක ව්‍යාප්ත රුක් සංරක්ෂණ වැඩ පිළිවෙලක් දියත් කරන ලදී. මේ හේතුවෙන්, මේ සම්බන්ධව ලෝක රුක් සුරැකීමේ වැඩ පිළිවෙලක් ප්‍රකාශයට පත්වූ අතර, බොහෝ රටවල් ඒ වෙනුවෙන් ජාතික සංරක්ෂණ වැඩ මුළු ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකාවද මේ කාර්යය සඳහා එක්වූ අතර කේ.එච්.ජේ. විජේදාස මහතාගේ සභාපතිත්වයෙන් සහ පරිසර සම්පත් සුරැකීමේ අන්තර් ජාතික සංවිධානයේ සහයෝගයෙන් මෙම කාර්යය ආරම්භ කෙරිණි.

රුක් ව්‍යාපාරය ආරම්භ කෙරුනේ, නිවර්තන කලාපීය වනාන්තර සහ මිනිසාගේ පැවැත්මට එම වනාන්තර වලින් සිදුවන අමිල සේවය කෙරෙහි මුළු ලොවේම සාර්ථක අවධානය යොමු වීමත් සමඟය. එම වනාන්තර, මනුෂ්‍යයාට ඥාණාන්විතව ප්‍රයෝජනයට ගැනීම සහ අනාගත පරම්පරාව උදෙසා ඒවා ආරක්ෂා කිරීම ගැන දැඩි අවධානය යොමු විය.

ශාඛ සම්පතින් පොහොසත් ලෝකයේ ඇතැම් තෝරා ගත් පෙදෙස්වලට, මෙම ව්‍යාපාරයෙන් වැඩි අවධානය යොමු කරන ලදී. මෙම ප්‍රදේශ වැඩි වශයෙන්ම තර්ජනයට සහ අනතුරට භාජනය වූ ප්‍රදේශද විය. මේ අනුව ශ්‍රී ලංකාවේදී වැඩි සැලකිල්ලට භාජනය වන්නේ සිංහ රාජ අඩවියයි. (වනාන්තරයයි.) ශ්‍රී ලංකාවේ දැනට ඉතුරුව ඇති එකම විශාල වන බිම් කඩ මෙය වන අතර පහත රට සදාහරිත වනාන්තරයද මෙය පමණි. ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන බහුතර ශාඛ වලින් අඩක් පමණ මෙහිදී දැකිය හැකි අතර, මෙම වනය ආරක්ෂා නොවුන හොත් ඒ සියළුම ශාඛයන් අපට අහිමිව යනු ඇත.

රුක් සංරක්ෂණයේ තවත් වැදගත් පරමාර්ථයක් වනුයේ, මූලික පරිසර සංරක්ෂණ කටයුතු වලටද, ලෝක ව්‍යාප්තව ආධාර තුරල්මද වේ. මේවා අතර:-

* ශාඛ වර්ධනයට ඉවහල් වන පරිසර සාධකයක් හැදෑරීම ඇතුළුව පරිසර ආරක්ෂාව සඳහා වගා පාලන ක්‍රම තීරණය කිරීම සහ ඒවා ඉතා හොඳින් හඳුන්වා දිය හැකි ප්‍රදේශ තීරණය කිරීම.

* ලෝකයේ වසන දස අහස් සංඛ්‍යාත ජනතාව විසින් ඔවුන්ගේ සෞඛ්‍ය සම්පත්තිය රැක ගැනීම උදෙසා පිහිට පතන ඖෂධීය වටිනාකමින් යුත් පැළෑටි සොයා ගැනීම - රැස්කිරීම සහ ආරක්ෂා කිරීම.

* බීජ හෝ ජීව ප්ලාස්ම ලෙස පවතින ප්‍රවේණි සම්පත් හඳුනාගැනීම රැස් කිරීම සහ ආරක්ෂා කිරීම. මෙය වඩා වැදගත් වන්නේ නොයෙකුත් බෝගයන්ගේ අනාගත අභිජනන සැලැස්මයන් සඳහා

ඉතා වැදගත් වන, එම භෝග කුලවලට අයත් මුත්, මෙතෙක් වනගතව තිබුණු පැළෑටි සොයා ගැනීමට හැකිවීමයි. මේවා සමඟ පවත්වන අභිජනන කටයුතු වලින්, රෝගවලට ඔරොත්තු දෙන උසස් නිෂ්පාදනයක් ඇති වර්ග නිපදවා ගත හැක.

* පේරාදෙණිය, රාජකීය උද්භිද උද්‍යානය වැනි ප්‍රධාන පෙළේ උද්‍යාන සම්බන්ධ කොට ගත් සංවර්ධන සැලැස්මවල් ආරම්භ කිරීමෙන් ශාඛ සංරක්ෂණය පිළිබඳව මහ ජනතාවට අවශ්‍ය ප්‍රවෘත්ති සහ අධ්‍යයනය ලබා දෙන මධ්‍යස්ථාන ලෙස ඒවා පවත්වා ගෙන යැම.

මේ සියළුම කටයුතු වල ගැබ් වූන ප්‍රධාන පරමාර්ථය වන්නේ, රුක් සංරක්ෂණ වැඩ පිළිවෙල සඳහා සෑම තරාතිරමකම පුද්ගලයන් සහභාගි කරවා ගැනීමයි. බලයේ සිටින රජයේ පටන් එක් එක් පුද්ගලයා දක්වාත්, විශ්ව විද්‍යාල පටන් පාසැල දක්වා මෙන්ම ග්‍රාමීය මට්ටමේ රක්ෂණ කණ්ඩායම් දක්වාත් මේ කටයුත්තට හවුල් විය යුතුය.

කෘෂිකර්මයේදී, කර්මාන්තයේදී සහ ඖෂධ නිෂ්පාදනයේදී මිනිසාට උපකාරී වන ශාඛ කෙරෙහි දැඩි අවධානය යොමු කළ යුතුයි. වඩා උද්යෝගිමත් උත්සාහයක් වනුයේ මෙම කාර්යය සඳහා සහභාගි වන්නන්, විවිධ සංරක්ෂණ කටයුතු වල ප්‍රායෝගිකව යෙදවීමයි.

අන්තර් ජාතික රුක් සංරක්ෂණ වැඩ පිළිවෙල යටතේ, ලෝක වන සතව ආරක්ෂක ආයතනය සහ පරිසර සම්පත් සුරැකුම් කටයුතු පිළිබඳ අන්තර් ජාතික සංවිධානය බලාපොරොත්තු වන්නේ ඒ ඒ රටවල ආණ්ඩු වලත්, මහජනතාවගේත් දැඩි අවධානය, රුක් සම්පත තැණවත්ව උපයෝගී කර ගැනීමේ වැදගත්කම කෙරෙහි යොමු කරවීමයි. මෙම රුක් සම්පතෙන් වැඩි කොටසක් අනාගත පරම්පරාව සඳහා ඉතිරිකර දීම මගින්, මුළු මිනිස් සංහතියටම විශ්වාසය තැබිය හැකි අනාගතයක් අයත් කරදීම යුතුකමක් ඉටු කිරීමකි.